මව්බිම 2020/01/30 පිටු 04

# ‘ගමට ගෙයක් - රටට හෙටක්’ දින 60න් නිවාස 14,022ක්

## සමාරම්භක ජාතික උත්සවය අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ ප්‍රධානත්වයෙන් පෙබරවාරි මස 01 වැනිදා

ක්‍රිෂාන් පතිරත් ජයසූරිය

අඩු ආදායම්ලාභී පවුල් වෙනුවෙන් නිවාස 14,022ක් ඉදිකිරීමේ "ගමට ගෙයක් රටට හෙටක්" ජාතික නිවාස සංවර්ධන වැඩසටහනේ සමාරම්භක ජාතික උත්සවය අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් හා නිවාස පහසුකම් රාජ්‍ය අමාත්‍ය ඉන්දික අනුරුද්ධ මහතාගේ සහභාගීත්වයෙන් පෙබරවාරි මස 01 වැනිදා පෙරවරුවේ කුරුණෑගල, ගිරිබාවේදී පැවැත්වේ.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ "රට හදන සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ ඵලදායී පුරවැසියෙක් සහ සතුටින් ජීවත්වන පවුලක් නිර්මාණය කිරීම සඳහා සෑම පවුලකටම සුවපහසු ස්ථිර නිවෙසක් අත්කර දීම තුළින් සාර්ව ආර්ථික ඉලක්ක සපුරා ගැනීම සහතික කර ඇත. එම අරමුණ වෙත ළඟාවීමේ පළමු පියවර ලෙස අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ සංකල්පය සහ මාර්ගෝපදේශකත්වය මත 2020 වසර තුළ දිවයිනේ අඩු ආදායම්ලාභී පවුල්වල නිවාස ගැටලුව සම්පූර්ණයෙන්ම විසඳීමේ අරමුණින් "ගමට ගෙයක් රටට හෙටක්" නිවාස 14,022ක් ඉදිකිරීමේ වැඩසටහන ආරම්භ කිරීමට පියවර ගෙන ඇත. මේ යටතේ සෑම ග්‍රාම නිලධාරී වසමක් නියෝජනය කරමින් තෝරාගනු ලබන අඩු ආදායම්ලාභී පවුලක් සඳහා එක් නිවෙසක් බැගින් ඉදිකෙරෙන අතර එම නිවාස ඉදිකිරීමේ කටයුතු දින 60ක් තුළ අවසන් කිරීමට නියමිත වේ.

මෙම ව්‍යාපෘතිය සඳහා මහා භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 8413.2 ප්‍රතිපාදන නිවාස අමාත්‍යාංශය සඳහා වෙන්කර ඇත. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි.

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් 2011 වර්ෂයේදී සිදු කරන ලද ජන හා නිවාස සංගණනයට අනුව දළ වශයෙන් ශ්‍රී ලංකාව තුළ නිවාස අවශ්‍යතාව 455,000ක් වන අතර වැඩි දියුණු කළ යුතු නිවාස සංඛ්‍යාව 534,000කි. එම පවුල් අතරින් බහුතරයක් දිළිඳු හෝ අඩු ආදායම්ලාභී පවුල් වේ. පොල් අතු සහ තල් අතු සෙවිලි කළ තාවකාලික නිවාස 2020 වසරේදී මෙරටින් ඉවත් කිරීම සඳහා ඉලක්කගත වැඩසටහනක් ලෙස නිවාස සංවර්ධන වැඩසටහන අදියර වශයෙන් ක්‍රියාත්මක කිරීමට නියමිතය.

පසුගිය රජය තම දේශපාලන වුවමනාවන් ඉටුකර ගැනීම සඳහා ජනතාවට නොමිලේ නිවාස ලබාදෙන බව පෙන්වමින් මෙරට දුගී දුප්පත් ජනතාව තව තවත් ගැටලු රැසකට මැදිකොට මේ වන විට ඔවුන්ව අන්ත අසරණ තත්ත්වයකට පත්කොට ඇත. එම තත්ත්වය පිළිබඳව වත්මන් රජයේ විශේෂ අවධානය යොමුකර ජනාධිපතිතුමන්ගේ සහ අග්‍රාමාත්‍යතුමන්ගේ සංකල්පයක් මත නිවාස රාජ්‍ය අමාත්‍යතුමාගේ මෙහෙයවීමෙන් අඩු ආදායම්ලාභී ජනතාවගේ නිවාස ගැටලුවලට සැබෑ ලෙසම ස්ථිර විසඳුම් ලබාදීම සඳහා මෙම වැඩසටහන නිර්මාණය කර ක්‍රියාවට නංවනු ඇත.

ප්‍රතිලාභීන් තෝරා ගැනීම පහත නිර්ණායකයන් යටතේ සිදු කෙරේ. ස්ථිර පදිංචිය ලබා ඇති නමුත් ස්ථිර නිවෙසක් නොමැති අඩු ආදායම්ලාභී පවුලක් වීම, කාන්තා මූලික පවුලක් වීම, ආබාධ සහිත පුද්ගලයන් සිටීම සහ දිගුකාලීන නිදන්ගත රෝගවලින් පෙළෙන පුද්ගලයන්ගෙන් සමන්විත වීම සහ නිවෙසක් තනාගැනීමේ අභියෝගයට මුහුණ පා සිටින පවුලක් වීම, යැපෙන්නන් වැඩි සංඛ්‍යාවක් සිටින සහ පාසල් යන වයසේ දරුවන් වැඩි සංඛ්‍යාවක් සිටින පවුලක් වීම, පාරම්පරික දේපළ හෝ වත්කම් හෝ භාරයන් සඳහා හිමිකම් නොතිබීම යන නිර්ණායක සඳහා ප්‍රමුඛත්වය හිමිවේ.

නිවාස ඉදිකිරීම සඳහා සුදුසු නිවාස සැලසුම් සකස් කිරීම ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නිර්දේශ මත සිදුවේ. රුපියල් ලක්ෂ 6ක ප්‍රතිපාදන සීමාව තුළ පිරිවැය කළමනාකරණය කරගත හැකි වන පරිදි සෑම නිවෙසක්ම වර්ග අඩි 550ක උපරිම වපසරියකට යටත්ව සැලසුම් කරනු ඇත. ඉදිකරනු ලබන සෑම නිවෙසක්ම අවම වශයෙන් මුළුතැන්ගෙයක්, සාලයක්, නිදන කාමරයක් සහ වැසිකිළියකින් සමන්විත වේ. නිවාස ඉදිකරන භූමිය තුළ ගෙවතු වගා සහ රුක්රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කෙරේ. ප්‍රතිලාභීන්ගේ අවශ්‍යතාව මත නම්‍යශීලීව නිවාස ඉදිකර ගැනීම සඳහා තාක්ෂණික ක්‍රමවේදය සහ උපදෙස් නිසි පරිදි ලබාදීම ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ තාක්ෂණ නිලධාරීන් විසින් සිදුකරනු ලබයි.